# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1924/31 – 2015 ජූලි 22 වැනි බදාදා – 2015.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/13/01/2007.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. කේ. එස්. එම්. ඩයස් මයා, අංක 598/බී, හිරිඹුර පාර, ගාල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු අමාත්‍ය, එස්. බී. නාවින්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සීදූව, ලියනගෙමුල්ල, කොළඹ පාර, අංක 42ඩී, කේ. ඒ. ටී. ප්‍රනාන්දු මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එස්. බී. නාවින්න,
කම්කරු අමාත්‍ය.

2015 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/01/2007.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. කේ. එස්. එම්. ඩයස් මයා, අංක 598/බී, හිරිඹුර පාර, ගාල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරනු ලබන එම්. කේ. එස්. එම්. ඩයස් මහතා එම අධිකාරයේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව 1990.06.01 දින සිට 5(II) කාර්මික නිලධාරි තනතුර හා 1992.06.01 දින සිට 5(I) කාර්මික නිලධාරි තනතුරද 1997.06.01 දින සිට 4 ශ්‍රේණියේ ඉංජිනේරු ශ්‍රේණියද එසේම ඊටපසු කාලයන්ට අදාළවද ඉංජිනේරු සේවයේ ඉහළ ශ්‍රේණීන්ද සියලු හිඟ වැටුප් සමග ඉල්ලා සිටීම යුක්තිසහගතද? එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2015 ජූලි මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.